තොරතුරු මාසිකය

# විමර්ශන

2026 ඔක්තෝබර්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# ආර්ථික අර්බුදය සමනය කර ගැනීම

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළිත් හිස ඔසවමින්, ස්ථාවර වෙමින් ඉදිරියට යමින් තිබේ. මෙම වර්ධනය සංසන්දනය කළ යුත්තේ, රට වසර කිහිපයකට කලින් තිබුණු තැන සිට වසර දෙකක් වැනි කෙටි කාලයකදී ලබා ගත් ජයග්‍රහණ සමඟය. පැවැතුණු දරුණු ආර්ථික අර්බුදයක් සහ බංකොළොත් ආර්ථිකයක් ස්ථාවර ආර්ථිකයක් වශයෙන් නැවත ස්ථාපනය කිරීමම විශාල ජයග්‍රහණයකි.**

එය 2025 වසරේ සහ 2026 වසරේ ආර්ථික දත්ත දෙස බලන විට පැහැදිලිව පෙනේ. ලෝකයේ යුදමය තත්ත්වයන් නිසා බහුතර රටවල ආර්ථික වර්ධනයන් මන්දගාමී ස්වරූපයක පවතිද්දී පවා එම සියලු බාහිර කම්පනයන්ට ඔරොත්තු දෙමින්, එම අර්බුදවලට මුහුණ දෙමින්ම ආර්ථිකය ඉදිරියට ගෙන යාමට ලංකාවේ ආණ්ඩුව සමත් වී සිටී. එලෙසම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟවූ කොන්දේසිවලටද යටත්ව එම කොන්දේසි සාර්ථකව ඉටු කරමින්ම ආර්ථිකය හැසිරවීම සරල කාරණයක් නොවේ. උදාහරණයක් ලෙස දළ දේශීය නිෂ්පාදනයේ වටිනාකමින් 13.5%ක ප්‍රමාණයක බදු ආදායමක් ලබාගත යුතු බවට කොන්දේසියක් පැවැති අතර, ශ්‍රී ලංකා රජය බදු අනුපාතවල කිසිදු වෙනසක් නොකර එම ප්‍රතිශතය 15.5%ක් දක්වා 2025 වසරේ ඉහළ නංවා ගත්තේය. ශ්‍රී ලංකාව බදු ආදායම ලෙස 2022 වන විට ළඟා කරගෙන තිබුණේ 9.9%ක් ලෙසය. එලෙසම ප්‍රාථමික ගිණුමේ අයවැය අතිරික්තය දළ දේශීය නිෂ්පාදනයෙන් 2.3%ක ප්‍රමාණයක රඳවාගත යුතු බවට කොන්දේසියක්වූ අතර, රජය විසින් එය 2025 වසරේදී 5.4%ක ප්‍රමාණයකට වර්ධනය කරගෙන තිබිණි. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධාන ඉලක්කවලට වඩා ඉතා ඉහළ ප්‍රගතියක් ශ්‍රී ලංකා ආර්ථිකය ලබාගෙන තිබිණි. එනිසාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ ක්‍රියාකාරීත්වය පැසසුමට ලක් කර තිබිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි නිසාම නොව ආණ්ඩුවේ යහපත් ආර්ථික කළමනාකරණයද මෙම කෙටි කාලයේදී ලබා ගත් ආර්ථික ජයග්‍රහණ සඳහා ඉවහල් වී ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ බොහෝ අංශ ප්‍රමාණාත්මක වර්ධනයක් අත්පත් කරගෙන ඇති අතර දශක ගණනක් පුරා පැවැති ආර්ථික අර්බුදය යම්කිසි ප්‍රමාණයකින් සමනය කර ගැනීමක් දැකගත හැකිය. ලංකාවට ප්‍රධාන විදේශ විනිමය ලැබෙන මාර්ග දෙකක් වන සංචාරක ව්‍යාපාරයේ සහ විදෙස් ශ්‍රමික ප්‍රේෂණවල හැසිරීම වසර දෙකක මාස කිහිපයක් තුළ පහත 01 වගුව පරිදි වේ.

**සංචාරක ව්‍යාපාරයේ සහ විදෙස් ශ්‍රමික ප්‍රේෂණවල හැසිරීම**

| විස්තරය | | 2025 (ජන- අගෝ) | 2026 (ජන- අගෝ) |
|---|---|---|---|
| විදෙස් ශ්‍රමික ප්‍රේෂණ | ඩො.මි. | 5,116 | 6,131 |
| සංචාරක ව්‍යාපාරය | ඩො.මි. | 2,290 | 2,061 |
| | | | 01 වගුව |

ඉහත සංඛ්‍යාවලට අනුව මාස 08ක කාලය තුළ 2025 වසරට සාපේක්ෂව 2026 වසරේ විදෙස් ශ්‍රමික ප්‍රේෂණ 20%කින් පමණ ඉහළ ගොස් ඇත. එහෙත්, සංචාරක ව්‍යාපාරයේ 10%ක පමණ අඩුවීමක් සිදුවී ඇති අතර, එය ගෝලීය යුදමය තත්ත්වය සමඟ සිදුවන සාමාන්‍ය දෙයකි.

ඉහත සඳහන් කළ ආකාරයටම පසුගිය වසරට සාපේක්ෂව 2026 වසරේද රාජ්‍ය ආදායම ඉතා විශාල ලෙස ඉහළ නංවාගෙන තිබේ. එය පහත 02 වගු සටහනින් පැහැදිලි කළ හැකිය.

**2026 වසරේදී රාජ්‍ය ආදායම**

| විස්තරය | | 2025 (ජන- අගෝ) | 2026 (ජන- අගෝ) |
|---|---|---|---|
| රාජ්‍ය ආදායම | රු.බිලියන | 2,729 | 3,417 |
| ප්‍රාග්ධන වියදම | රු.බිලියන | 3,000 | 3,149 |
| | | | 02 වගුව |

ඉහත සංඛ්‍යා අනුව 2025 මුල් මාස අටේ රාජ්‍ය ආදායමට සාපේක්ෂව 2026 මුල් මාස අට සඳහා රාජ්‍ය ආදායම 25%කින් පමණ ඉහළ නංවාගෙන ඇත. බදු අනුපාතවල වැඩිවීමක් නොමැතිව මෙලෙස රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම ජනතාවට සහන සැලැසීමේදී මහත් පිටිවහලක් වී ඇත. එලෙසම ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් අර්බුදය හේතුවෙන් මිල ඉහළ යාම ජනතාවට බරක් නොවන ආකාරයට කළමනාකරණය කර ගැනීමට හැකියාව ලැබුණේද මෙලෙස ඉහළ නංවාගත් බදු ආදායමේ කොටසයි. අනෙක් අතට ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදම් ඉහළ නංවා ගැනීමටද රජය කටයුතු කර ඇති අතර, එයද අනාගත ආර්ථික වර්ධනය සඳහා උපකාරී වනු ඇත.

දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයත් සමඟ ලංකාවේ අපනයන ආදායමේද ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. එම ප්‍රගතිය ආනයන වියදම ඉහළ යාමෙන් සිදුවන අවාසිය යම්තාක් දුරකට සමනය කර ගැනීම සඳහා ඉවහල් වේ.

ඒ අනුව ආනයන වියදම 25%කින් ඉහළ ගියද, එහි සම්පූර්ණ අවාසිය අපනයන ආදායමේ ඉහළ යාම නිසා පියවා ගැනීමට හැකි වී තිබේ. (03 වගුව)

| විස්තරය | 2025 ජන/පෙබ ඩොලර් මිලි. | 2026 ජන/පෙබ. ඩොලර් මිලි. |
|---|---|---|
| අපනයන | 2,106 | 2,207 |
| ආනයන | 3,250 | 3,637 |
| වෙළඳ ශේෂය | -1,144 | -1,430 |
| වගු අංක 03 | | |

මේ සියලු යහපත් තත්ත්වයන් යටතේ වුවද, ආර්ථිකය කළමනාකරණය කරමින්, ඉදිරියට ගෙන යාම සරල කරුණක් නොවේ. මේ වන විට ආර්ථිකයේ භාණ්ඩ හා සේවා මිල යම්කිසි මිල ඉහළ යාමක් දක්නට ලැබෙන අතර, එය ආර්ථිකයේ ජනතාවට දරා ගැනීමට නොහැකි මට්ටමේ ඉතා අසීරු තත්ත්වයක් නොවේ. ආර්ථිකය ප්‍රසාරණය වීමේදී තාවකාලික උද්ධමනකාරී තත්ත්වයන් මතු වන අතර, එය කිසියම් කාලයකදී ස්ථාවර තත්ත්වයට පත් කර ගැනීමේ හැකියාව ඇත.

07 කලාපය

# සම්බාධක නොතකා ඉදිරියට යන කියුබානු විප්ලවය

**වසර 66ක් පුරා ඇමෙරිකා එක්සත් ජනපදය විසින් කියුබාවට එරෙහිව පනවා ඇති විවිධ ස්වරූපයේ ආර්ථික, වෙළෙඳ සහ මූල්‍ය සම්බාධක (Embargo) ලෝක ඉතිහාසයේ රාජ්‍යයක් වෙත පනවා ඇති දීර්ඝතම ඒකපාර්ශ්වික සම්බාධක පැනවීම ලෙස සැලරකේ. සැතපුම් 90කට ඔබ්බෙන් සිටින බලවත් අසල්වැසියා වන එක්සත් ජනපදය විසින් පවත්වාගෙන එනු ලබන මෙම සම්බාධක ක්‍රියාවලිය කියුබාවේ ජන ජීවිතයට මෙන්ම දේශපාලන හා ආර්ථික ගමන අඩාළ කිරීමට ප්‍රබල ලෙස බලපා ඇත.**

### සම්බාධක ඉතිහාසය

- සම්බාධක ආරම්භය (1959-1960) - 1959දී කියුබානු විප්ලවය ජයග්‍රහණය කිරීමෙන් පසු, එරට තිබූ ඇමෙරිකානු සමාගම් සතු දේපළ ජනසතු කිරීමට කියුබානු රජය පියවර ගත්තේය. මෙයට ප්‍රතිචාර වශයෙන් කියුබාවෙන් සීනි මිලදී ගැනීම තහනම් කරමින්, 1960දී එවකට ඇමෙරිකානු ජනාධිපති, අයිසෙන්හවර් පළමු සම්බාධක පැනවීම සිදු කළේය.

- පූර්ණ තහනමක් පැනවීම (1962) - කියුබාව, සෝවියට් දේශය සමග සමීප සබඳතා පැවැත්වීම සහ තමන් සමාජවාදී රාජ්‍යයක් බව ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් 1962 පෙබරවාරි මාසයේදී ජනාධිපති, ජෝන් එෆ්. කෙනඩි විසින් කියුබාව සමඟ කෙරෙන සියලුම වෙළෙඳ කටයුතු පූර්ණ ලෙස තහනම් කරමින් සම්බාධක තීව්‍ර කළේය.

- නෛතික ලෙස තහවුරු කිරීම (1990 දශකය) - ප්‍රධානම වෙළෙඳ සහකරුවූ සමාජවාදී සෝවියට් දේශය බිඳවැටීමෙන් පසු කියුබාව දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටි අවස්ථාවේදී ඇමෙරිකාව 1992දී Torricelli Act සහ 1996 දී Helms-Burton Act වැනි පනත් මගින් වෙනත් රටවල් කියුබාව සමග වෙළෙඳ සබඳතා පැවැත්වීම වැළැක්වීමට කටයුතු කළ අතර, සම්බාධක ඉවත් කිරීමේ බලය ඇමෙරිකානු කොන්ග්‍රස් මණ්ඩලය සතු කරන ලදී.

- සම්බාධක ලිහිල් වීම (2014-2016) - ජනාධිපති බැරැක් ඔබාමාගේ පාලන සමයේදී දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නැවත ආරම්භවූ අතර, සංචාරක හා මූල්‍ය රෙගුලාසි යම් ප්‍රමාණයකට ලිහිල් කෙරිණි.

- නැවත සම්බාධක තීව්‍ර වීම (2017-2021) - ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පාලනය විසින් ඔබාමාගේ ප්‍රතිපත්ති වෙනස් කරමින්, නැවතත් ක්ෂේත්‍ර 240කට අධික ප්‍රමාණයකට අදාළව සම්බාධක පැනවීය. එහිදී සම්බාධක තීව්‍ර කිරීමට හේතුවක් ලෙස (කිසිදු පදනමක් නොමැති වුවද) කියුබාව 'ත්‍රස්තවාදයට අනුග්‍රහය දක්වන රාජ්‍යයක්' (State Sponsor of Terrorism) ලෙස නම් කරනු ලැබීමද විශේෂත්වකි.

### සම්බාධක වර්තමාන තත්ත්වය

එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ දෙවැනි ධුර කාලය තුළ 2026 වසර වන විට කියුබාවට එරෙහි සම්බාධක මානුෂීය, ආර්ථික සහ සමාජයීය වශයෙන් දැඩි පීඩාකාරී තත්ත්වයකට පැමිණ ඇත. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඩොනල්ඩ් ට්‍රම්ප් පාලනය විසින් ක්‍රියාත්මක කරන 'උපරිම පීඩනය' (Maximum Pressure) සහ ඉන්ධන අවහිර කිරීමේ (Fuel Blockade) දැඩි උපායමාර්ගය හේතුවෙන් මේ වන විට කියුබානු රාජ්‍යය සිය නිදහසින් පසු මුහුණ දෙන දරුණුතම අර්බුදයට මැදිව සිටී.

වත්මන් තත්ත්වය ප්‍රධාන අංශ කිහිපයක් යටතේ හඳුනාගත හැකිය.

#### 1. බලශක්ති පද්ධතියේ බිඳවැටීම

2026 වසරේ මුල් භාගයේ (විශේෂයෙන් මාර්තු මාසයේ) සිට කියුබාවේ ජාතික විදුලිබල පද්ධතිය කිහිප වරක්ම සම්පූර්ණයෙන්ම අක්‍රිය විය. කියුබාවට සාම්ප්‍රදායිකව තෙල් සැපයූ වෙනිසියුලාව සහ මෙක්සිකෝව වැනි රටවලින් පැමිණෙන තෙල් නැව් ඇමෙරිකාව විසින් වටලෑම සහ අවහිර කිරීම මෙයට ප්‍රධාන හේතුවයි.

- පැය 20ක විදුලි කප්පාදුව - දිවයිනේ ඇතැම් ප්‍රදේශවල දිනකට පැය 20ත් 22ත් අතර කාලයක් විදුලිය විසන්ධි කර පවතී.

- රටේ සමස්ත බලශක්ති පද්ධතියෙන් 74%කට වඩා එකවර අක්‍රියවූ අවස්ථාද මෑතකාලීනව වාර්තා විය.

- ඉන්ධන හිඟය නිසා කසළ ප්‍රවාහන රථ ධාවනය අත්හිටුවීම හේතුවෙන් හවානා අගනුවර ඇතුළු නගර පුරා කැළිකසළ එකතු වීමේ සෞඛ්‍ය තර්ජන මතු වී ඇත.

#### 2. මානුෂීය අර්බුදය

එක්සත් ජාතීන්ගේ විශේෂඥයන් පෙන්වා දෙන්නේ කියුබාව මේ වන විට 'නිහඬ ගාසා තීරයක්' (Silent Gaza) බවට පත්වීමේ අවදානමක පවතින බවයි.

- ඖෂධ හිඟය - රටේ අත්‍යවශ්‍ය මූලික ඖෂධවලින් 80%කට වඩා හිඟව පවතී. එන්නත් සහ ඖෂධ ගබඩා කර තැබීමට අවශ්‍ය ශීතකරණ පද්ධති විදුලිය නොමැතිකමෙන් අක්‍රිය වෙමින් පවතී.

- රෝග ව්‍යාප්තිය - ඩෙංගු, චිකුන්ගුන්යා වැනි වෛරස් රෝග ව්‍යාප්ත අවදානම ඉහළ යමින් ඇත.

- ළදරු මරණ අනුපාතය - සෞඛ්‍යය බිඳවැටීම නිසා 2018දී 1000කට 04ක්ව පැවැති ළදරු මරණ අනුපාතය මේ වන විට 9.9ක් දක්වා ඉහළ ගොස් තිබේ.

- ආහාර හිඟය - ඉන්ධන නොමැතිකම හේතුවෙන් වගාවල අස්වනු නෙළීමට නොහැකිවී ඇති අතර, ආහාර නිෂ්පාදනය 60%කින් පහත වැටී ඇත. මිලියන 3.5කට අධික ජනතාවකට පිරිසිදු ජල සැපයුම අහිමිවී ඇත.

#### 3. නව නීති සහ මූල්‍ය සම්බාධක (2026 සැප්තැම්බර්)

ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් 2026 මැයි මාසයේදී පැනවූ Executive Order 14,404 නීතිය තවදුරටත් ශක්තිමත් කරමින්, 2026 සැප්තැම්බර් 30 දින සිට නව කියුබානු සම්බාධක රෙගුලාසි (Cuba Sanctions Regulations - CSR) මාලාවක් බලාත්මක කර ඇත.

- මූල්‍ය අවහිරතා - කියුබාව සමග වක්‍රව හෝ මූල්‍ය ගනුදෙනු කරන ඕනෑම විදේශීය බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ දඬුවම් පැමිණවීමට සහ ඇමෙරිකානු මූල්‍ය පද්ධතියට ප්‍රවේශය තහනම් කිරීමට නව නීති මගින් බලය පැවරී ඇත.

- සංචාරක තහනම - ඇමෙරිකානුවන්ට කණ්ඩායම් වශයෙන් කියුබාවේ සංචාරය කිරීම සහ වෘත්තීය සමුළුවලට සහභාගීවීම පූර්ණ ලෙස තහනම් කර ඇත. කියුබාවේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සංචාරක කර්මාන්තය මේ නිසා සම්පූර්ණයෙන්ම පාහේ කඩාවැටී ඇත.

- කර්මාන්ත ඉලක්ක කිරීම - කියුබාවේ නිකල් වැනි ඛනිජ සම්පත් නිපදවන සමාගම් සහ හමුදාව සම්බන්ධ ව්‍යාපාර ඉලක්ක කර ගනිමින් සැප්තැම්බර් මාසයේදී නව සමාගම් රැසක් එක්සත් ජනපද අසාධු ලේඛනයට (SDN List) ඇතුළත් කෙරිණි.

#### 4. ආර්ථික ප්‍රතිසංස්කරණ සහ දේශපාලන සාකච්ඡා

මෙම අර්බුදකාරී තත්ත්වය හමුවේ කියුබානු රජය මෙතෙක් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිවල යම් වෙනස්කම් කිරීමට තීරණය කර ඇත.

07 පිටුවට

# චුම්භකත්වයේ නව ආකාරයක්!

**වර්තමාන ලෝකයේ අප භාවිත කරන විදුලියෙන් වැඩිම කොටසක් නිෂ්පාදනය කෙරෙන්නේ චුම්භකත්වය භාවිත කරමිනි. ඛනිජ තෙල්, ගෑස්, ගල්අඟුරු ආදී පොසිල ඉන්ධන මඟින් විදුලිය නිපදවද්දී මෙන්ම ජල විදුලිය, සුළං බලාගාර ආදී ලෙස ටර්බයින හරහා විදුලිය නිපදවන සෑම අවස්ථාවක දීම ප්‍රයෝජනයට ගන්නේ චුම්භකත්වයයි. එමෙන්ම අප එදිනෙදා ජීවිතයේ භාවිත කරන විදුලි උපකරණ අතුරින් බහුතරයක් චුම්භකත්වය භාවිත කරමින් නිපදවූ ඒවා වේ.**

අප එතරම් ප්‍රයෝජන ප්‍රමාණයක් චුම්භකත්ව ගුණාංග ඇසුරින් ලබා ගනු ලැබුව ද, මෑතක් වන තුරු විද්‍යාඥයන් දැනසිටියේ අප අවට පවතින ද්‍රව්‍ය තුළ ස්වාභාවිකව පැවැතිය හැකි චුම්භකත්ව ආකාර දෙකක් ගැන පමණි. එනම්,

1. **ෆෙරෝචුම්භකත්වය** (Ferromagnetism)

2. **ප්‍රතිෆෙරෝචුම්භකත්වය** (Antiferromagnetism)

නම් ආකාර දෙකයි. (මේවා ස්වාභාවිකව පවත්නා ආකාර වන අතර, බාහිර බලපෑම මඟින් චුම්භකත්වය ඇති විය හැකි ආකාර දෙකක් ද පවතී. ඒවා Diamagnetism, Paramagnetism නම් වේ.)

ස්වාභාවික ලෝකයේ පවතින චුම්භකත්ව ආකාර ලෙස මෙතෙක් අප දැන සිටි ආකාර දෙකට අමතරව තවත් 3වන ආකාරයක් පවතින බව පසුගිය දා විද්‍යාඥයෝ තහවුරු කරගෙන ඇත. මෙම 3වන චුම්භකත්ව ආකාරය ඕල්ටර්-මැග්නටිසම් (Altermagnetism) ලෙස නම් කර ඇත. අප අවට පවතින ද්‍රව්‍ය තුළ 3වැනි චුම්භකත්ව ආකාරයක් පැවැතිය හැකි බවට ගණිතමය සහ න්‍යායාත්මක ලෙස පෙන්වා දෙන ලද්දේ 2019-2022 වසරවලදී ය. ඒ ජර්මනියේ මයින්ස් විශ්වවිද්‍යාලයේ සහ චෙක් ජනරජයේ විද්‍යා ඇකඩමියේ විද්‍යාඥයන් පිරිසක් විසිනි. මෙම න්‍යායාත්මක කරුණු නිවැරැදි බවටත්, එය ස්වාභාවික ලෝකයේ පවතින බවටත් පර්යේෂණාත්මකව තහවුරු කරන ලද්දේ 2024 වසරේ පෙබරවාරි මාසයේදී ය.




### ෆෙරෝචුම්භකත්වය -

යම් වස්තුවක අන්තර්ගත ඉලෙක්ට්‍රෝනවල බමනයන් (Spin) එකම දිශාවකට පිහිටන අවස්ථාව මෙම නමින් හැඳින්වේ. මෙලෙස බමන එකම දිශාවකට පැවැතීම නිසා ප්‍රබල චුම්භක ක්ෂේත්‍රයක් බාහිරින් නිර්මාණය වේ. සාමාන්‍ය චුම්භකවල දැකිය හැක්කේ මෙම ආකාරයයි.

### ප්‍රතිෆෙරෝචුම්භකත්වය -

යම් වස්තුවක අන්තර්ගත ඉලෙක්ට්‍රෝනවල බමනයන් මාරුවෙන් මාරුවට, ප්‍රතිවිරුද්ධ දිශාවලට පිහිටීම මෙම නමින් හැඳින්වේ. මෙලෙස ප්‍රතිපක්ෂ දිශාවලට පිහිටීම නිසා එවැනි වස්තුවල චුම්භක ක්ෂේත්‍රයක් බාහිරට ඇති වන්නේ නැත (එක් එක් ඉලෙක්ට්‍රෝන බමනයන් මඟින් ඇති කරනු ලබන බලයන් ප්‍රතිවිරුද්ධ නිසා).




### ඕල්ටර්මැග්නටිසම් -

මෙය ෆෙරෝචුම්භකත්වය සහ ප්‍රතිෆෙරෝචුම්භකත්වය යන ආකාර දෙකෙහිම ලක්ෂණ ඇතුළත්ව ඇති ආකාරයකි. මෙහි ඉලෙක්ට්‍රෝනවල බමනයන් එකම දිශාවකට නොපිහිටන නිසා බාහිරට චුම්භක ක්ෂේත්‍රයක් නොපෙන්වයි. එහෙත්, මෙම ද්‍රව්‍යවල ස්ඵටික දැල හරහා ඉලෙක්ට්‍රෝන ගමන් කිරීමේදී ඒවායේ බමන එකම දිශාවකට ඇති ෆෙරෝචුම්භකත්වයේ හැසිරීමක් පෙන්වයි. ඕල්ටර්මැග්නටික් ද්‍රව්‍යවල බාහිරට චුම්භක බලයක් නොපෙන්වුව ද, ඒවායේ පවතින ස්ඵටික ව්‍යුහය යම් නියමිත කෝණයකට භ්‍රමණය වී පවතින නිසා ඒ හරහා ඉලෙක්ට්‍රෝන ගමන් කිරීමේදී උතුරු දිශාවට බමනය වූ ඉලෙක්ට්‍රෝන එක් ශක්ති මට්ටමකින් සහ දකුණු දිශාවට බමනය වූ ඉලෙක්ට්‍රෝන තවත් ශක්ති මට්ටමකින් ගමන් කරයි. ඒ අනුව එක් ශක්ති මට්ටමකදී ඉලෙක්ට්‍රෝනවල බමනය එකම දිශාවකට පෙළගැසීමේ ගුණය ෆෙරෝචුම්භකත්ව ආකාරයක් ලෙස හඳුනාගෙන ප්‍රයෝජනයට ගත හැකි ය.

මෙම ඕල්ටර්-මැග්නටිසම් ගුණය තනි මූලද්‍රව්‍යයන් තුළ නොපිහිටන අතර, සංක්‍රාන්ති ලෝහ (මැංගනීස්, රුතේනියම්, යකඩ, කොබෝල්ට්, ක්‍රෝමියම්, නිකල්) සහ අලෝහ (ටෙලියුරියම්, ඔක්සිජන්, ෆ්ලුවොරීන්, සල්ෆර්, ආසනික්) එක්ව සෑදුණු සංයෝග තුළ දක්නට ලැබේ. මෙලෙස එක්ව සෑදුණු ඕල්ටර්මැග්නටිසම් ගුණය සහිත සංයෝගවලට උදාහරණ ලෙස මැංගනීස් ටෙලියුරයිඩ් (MnTe), රුතේනියම් ඩයොක්සයිඩ් (RuO2), මැංගනීස් ෆ්ලෝරයිඩ් (MnF2) දැක්විය හැකි ය.

මෙම සොයාගැනීම මඟින් අතිශය වේගවත් පරිගණක සහ දත්ත පද්ධති නිර්මාණය කිරීමේ හැකියාව පවතී. සාමාන්‍යයෙන් වර්තමානයේ පරිගණක තුළ භාවිත කෙරෙන ෆෙරෝචුම්භක පදනම් කර ගත් දත්ත මතකයන් (MRAM) ක්‍රියාත්මක වන වේගය මෙන් 1,000 ගුණයක් පමණ වැඩි වේගයක් මේ හරහා ලැබෙනු ඇත.

# කැනඩාව හා ඇමෙරිකා එක්සත් ජ
# චීන - කැනඩ

## 1. භූගෝලීය, ඓතිහාසික සහ ආර්ථික පදනම

කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර පවතින සබඳතාව භූගෝලීය, ඓතිහාසික සහ ආර්ථිකමය වශයෙන් තදින් එකිනෙක හා බැඳී පවතී. දෙරට අතර පවතින ගොඩබිම් දේශසීමාව කිලෝමීටර 9,000 (8,891 km)ක් පමණ වන අතර, එය ලොව පවතින දීර්ඝතම ජාත්‍යන්තර දේශසීමාව වෙයි. ආයෝජන, සැපයුම් දාම, බලශක්ති සහ ආරක්ෂක සබඳතා ආදී විවිධ අංශ ඔස්සේ මෙම සබඳතා ශක්තිමත්ව පවතී. දෙරට අතර පවතින අන්‍යෝන්‍ය ආයෝජන මඟින් මිලියන ගණනකට රැකියා උත්පාදනය වී ඇති අතර, දේශසීමා හරහා අඛණ්ඩව භාණ්ඩ හුවමාරුව මෙන්ම පුද්ගල ආගමන - විගමන ක්‍රියාවලියද සිදු වෙයි.

## 2. ද්විපාර්ශ්වික වෙළෙඳාම සහ බලශක්ති සහයෝගීතාව

▪ **වෙළෙඳ වටිනාකම:** 2024 වර්ෂයේ දත්තවලට අනුව දිනකට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.6කට ආසන්න භාණ්ඩ සහ සේවා ප්‍රමාණයක් දෙරට අතර හුවමාරු වේ. කැනඩාව යනු ඇමෙරිකා එක්සත් ජනපදයේ දෙවන විශාලතම වෙළෙඳ හවුල්කරුවායි.

▪ **ආයෝජන සබඳතා:** ඇමෙරිකා එක්සත් ජනපදය කැනඩාවේ විශාලතම ආයෝජකයා වන අතර, කැනඩාව ඇමෙරිකාවේ දෙවන විශාලතම ආයෝජකයා ලෙස ක්‍රියා කරයි.

▪ **බලශක්ති අංශය:** කැනඩාව සහ ඇමෙරිකාව එකිනෙකාගේ විශාලතම බලශක්ති සම්පාදකයන් වේ.

2024දී දෙරට අතර බලශක්ති වෙළෙඳාමේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 152ක් පමණ විය.

කැනඩාව ඇමෙරිකාවට සිදු කරන සමස්ත අපනයනවලින් 29%ක්ම බලශක්තියයි.

දෙරටේ දේශසීමා හරහා තෙල් සහ ස්වාභාවික වායු නළ මාර්ග 100කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන අතර, පිරිසිදු විදුලි සැපයුම ද සිදු කෙරේ.

කැනඩාවේ බනිජ තෙල් අපනයනයෙන් 89%ක් පමණ යොමු වන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයටයි.




▪ **ආරක්ෂක අංශය**

NORAD (North American Aerospace Defense Command): ඇමෙරිකාව සහ කැනඩාව එක්ව මෙහෙයවන උතුරු ඇමෙරිකානු ගුවන් හා සාගර ආරක්ෂක සංවිධානයයි. උතුරු ඇමෙරිකානු ගුවන් සීමාවට එල්ල වන මිසයිල සහ ගුවන් තර්ජන කල් තියා හඳුනා ගැනීම මෙන්ම දෙරටේම ගුවන් සීමාවන්හි ස්වාධිපත්‍යය සුරැකීම මෙහි ප්‍රධාන කාර්යභාරය වේ.

**Five Eyes සන්ධානය:** ඇමෙරිකාව, කැනඩාව, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය නියෝජනය කරන ලොව ප්‍රබලතම බුද්ධි තොරතුරු හුවමාරු කිරීමේ සන්ධානයයි. සයිබර් ආරක්ෂාව තහවුරු කිරීම, ජාත්‍යන්තර ත්‍රස්තවාදය වැළැක්වීම සහ විදේශීය බුද්ධි අංශවල බලපෑම් හඳුනා ගැනීම සඳහා දෙරට අතර උසස් මට්ටමේ බුද්ධි සහයෝගීතාවක් පවත්වා ගැනීමට මෙය මඟපාදයි.

**ආක්ටික් කලාපයේ ආරක්ෂාව සහ ඇමරිකා - කැනඩා සබඳතාව**

▪ දේශගුණික විපර්යාස හේතුවෙන් ආක්ටික් කලාපයේ හිම දිය වීමත් සමඟ නව වෙළෙඳ නාවික මාර්ග විවෘත වීම සහ අතිවිශාල ස්වාභාවික සම්පත් (තෙල්, ස්වාභාවික වායු සහ ඛනිජ) වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලැබී ඇත. මේ හේතුවෙන් රුසියාව සහ චීනය ආක්ටික් කලාපය තුළ සිය හමුදාමය සහ ආර්ථික බලපෑම තර කර ගැනීමට උත්සාහ කරන බවද නිරීක්ෂණය කළ හැකි ය.

▪ මෙම භූ-දේශපාලනික අභියෝග යට මුහුණ දීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය සහ කැනඩාව ඒකාබද්ධව උතුරු දේශසීමාවේ පිහිටි NORAD පූර්ව අනතුරු ඇඟවීමේ රේඩාර් ජාලය (North Warning System) නවීන තාක්ෂණයෙන් යාවත්කාලීන කිරීම, ආක්ටික් මුහුදු තීරයේ සහ ගුවන් සීමාවේ ආරක්ෂාව සඳහා ඒකාබද්ධ හමුදා අභ්‍යාස සහ මුර සංචාර පැවැත්වීම ආදිය සිදු කරනු ලබයි.

## 3. කැනඩා - එක්සත් ජනපද - මෙක්සිකෝ ගිවිසුම (CUSMA)

කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය සහ මෙක්සිකෝව අතර ආර්ථික සබඳතා ශක්තිමත් කරන ප්‍රධානතම ගිවිසුම වන්නේ 2020 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වන CUSMA (Canada-United States-Mexico Agreement) ගිවිසුමයි. මෙය පූර්වයෙන් පැවැති උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) යාවත්කාලීන කරමින් සැකසූ එකකි.

▪ **සමාලෝචන වගන්තිය:** වසර 6කට වරක් මෙම ගිවිසුම ඒකාබද්ධ සමාලෝචනයකට ලක් කළ යුතුය. පළමු සමාලෝචනය 2026 ජූලි 1 වන දිනට යෙදී තිබිණි.

▪ **දීර්ඝ කිරීමේ අර්බුදය:** ගිවිසුම ඉදිරි වසර 16කට දීර්ඝ කිරීමට කැනඩාව සහ

# නපදය අතර වෙළෙඳ ගැටුම සහ ා සබඳතාව



මෙක්සිකෝව කැමැත්ත පළ කළ ද, ඇමෙරිකා එක්සත් ජනපදය එය ප්‍රතික්ෂේප කරමින්, වාර්ෂිකව සමාලෝචනය කිරීමේ පදනමකට ප්‍රමුඛතාව ලබා දෙන ලදී.

## 4. වෙළඳ මතභේද සහ බදු පැනවීම්

▪ **2025 බදු අය කිරීම:** 2025දී ඇමෙරිකා එක්සත් ජනපදය විසින් කැනඩාවෙන් ආනයනය කරන ලද බලශක්ති නිෂ්පාදන මත 10%ක සහ අනෙකුත් ආනයන මත 25%ක බද්දක් පනවන ලදී. 2025 මාර්තු මාසයේදී දෙපාර්ශ්වය විසින්ම බදු ඉහළ දැමූ අතර, පසුව එම තත්ත්වය යම් තරමකට සමනය විය.

▪ **2026 බදු වර්ධනය:** 2026 අගෝස්තු මාසයේදී එවකට ඇමෙරිකානු ජනාධිපති, ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් කැනඩාවෙන් ගෙන්වන මෝටර් රථ, ට්‍රක්, වාහන අමතර කොටස්, වානේ, වයින් සහ සිමෙන්ති වැනි භාණ්ඩ සඳහා 50%කට අධික බද්දක් පනවන බව ප්‍රකාශ කරන ලදී. CUSMA ගිවිසුම භාවිත කරමින්, කැනඩාව අයුතු ලාභ ලබන බවට ද චෝදනා නැගිණි.

▪ **නීතිමය හා ආර්ථික බලපෑම:** මෙම අත්තනෝමතික බදු පැනවීම් ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවා අභියෝගයට ලක්වූ අතර, දෙරට අතර වෙළෙඳ මතභේදය තවදුරටත් උග්‍ර විය.

## 5. කැනඩා - චීන නව ආර්ථික හා වෙළෙඳ සබඳතා

ඇමෙරිකාව සමඟ ඇතිවූ වෙළෙඳ නොසන්සුන්තාවල බලපෑම ද සහිතව, 2026 ජනවාරි මාසයේදී කැනඩාව සහ චීනය අතර මූලික ආර්ථික හා වෙළෙඳ ගිවිසුමකට අත්සන් තබන ලදී.

▪ **බදු ලිහිල් කිරීම:** චීනයෙන් ආනයනය කරන විදුලි වාහන (EV) සඳහා පැවැති 100%ක බද්ද 6.1%ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු කරන ලදී.

> **කෙසේ නමුත් කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය නේටෝ (NATO) සංවිධානයේ ආරම්භක සාමාජිකයන් වෙයි. ඇමෙරිකා එක්සත් ජනපදය වැඩිම මුදලක් වාර්ෂිකව නේටෝවට සපයන අතර, නේටෝවට මුදල් සැපයීම අතින් සිව්වන ස්ථානයේ පසුවන්නේ කැනඩාවයි. එබැවින්, කැනඩාවේ වත්මන් පාලනය ට්‍රම්ප් පරිපාලනයට විරෝධී ස්ථාවරයක් දැරුව ද, කැනඩාවත්, ඇමෙරිකා එක්සත් ජනපදයත් ආර්ථිකමය වශයෙන් ද, මිලිටරිමය වශයෙන් ද තවමත් අවියෝජනීය ලෙස බැඳී පවතින බව ද අප අමතක නොකළ යුතු කරුණකි.**

▪ **වෙළෙඳ වර්ධනය:** 2026 පළමු අර්ධයේදී දෙරට අතර ද්විපාර්ශ්වික භාණ්ඩ වෙළෙඳාම 3.6%කින් ඉහළ ගිය අතර, කැනඩාවෙන් චීනයට කළ අපනයන 30.1%කින් වර්ධනය විය (විශේෂයෙන් බලශක්ති, ඛනිජ ද්‍රව්‍ය, කැනෝලා සහ කඩල අපනයනය).

▪ **ආනයන වෙනස්වීම:** චීනයෙන් කැනඩාවට කළ ආනයන 5.8%කින් අඩුවූ අතර, ඊට හේතු වූයේ ඉලෙක්ට්‍රොනික් සහ පාරිභෝගික භාණ්ඩ ආනයනය අඩුවීමයි.

▪ **දෙවන විශාලතම හවුල්කරු:** තනි රටක් ලෙස චීනය කැනඩාවේ දෙවන විශාලතම වෙළෙඳ හවුල්කරු බවට පත්ව සිටී.

වර්තමාන ගෝලීය තත්ත්වය දෙස බැලීමේ දී, ඇමෙරිකා එක්සත් ජනපදය ලොව පුරා පවතින හමුදාමය ගැටුම් සහ යුද්ධ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, සිය අත්තනෝමතික බදු ප්‍රතිපත්ති හරහා පවතින ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් හා වගකීම් ලිහිල් කරමින් සිටින බවක් දක්නට ලැබේ. ඊට පටහැණිව, චීනය ලෝකයේ විවිධ රටවල් සමඟ රාජ්‍යයන් අතර මිත්‍රත්වය වර්ධනය කර ගනිමින්, අන්‍යෝන්‍ය ආර්ථික සංවර්ධනය සහ වෙළෙඳ සහයෝගීතාව අරමුණු කර ගත් ප්‍රවේශයක් අනුගමනය කරමින් සිටී. කැනඩාව වැනි රටවල් සිය ආර්ථික සහකරුවන් විවිධාංගීකරණය කිරීමට පෙළැඹීම මගින් පැහැදිලි වන්නේ ගෝලීය ආර්ථිකයේ සහ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල සිදු වෙමින් පවතින මෙම ව්‍යුහාත්මක වෙනසයි. එසේම කැනඩාව සමඟ වෙළෙඳ සබඳතා වර්ධනය කර ගැනීමට චීනය අවධානය යොමු කිරීමට විශේෂ හේතුවක් ලෙස දේශගුණ විපර්යාස හේතුවෙන් ආක්ටික් කලාපයේ හිම දියවීම සමඟ ආක්ටික් කලාපයේ නව වෙළෙඳ නාවික මාර්ග විවෘත වීම මත සහ අතිවිශාල ස්වාභාවික සම්පත් ප්‍රමාණයක් වෙත පිවිසීමට හැකියාව ලැබීම ද සැලකිය හැකි ය.

කෙසේ නමුත්, කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය නේටෝ (NATO) සංවිධානයේ ආරම්භක සාමාජිකයන් වෙති. ඇමෙරිකා එක්සත් ජනපදය වැඩිම මුදලක් වාර්ෂිකව නේටෝවට සපයන අතර නේටෝවට මුදල් සැපයීම අතින් සිව්වන ස්ථානයේ පසුවන්නේ කැනඩාවයි. එබැවින්, කැනඩාවේ වත්මන් පාලනය ට්‍රම්ප් පරිපාලනයට විරෝධී ස්ථාවරයක් දැරුව ද, කැනඩාවත්, ඇමෙරිකා එක්සත් ජනපදයත් ආර්ථිකමය වශයෙන් ද, මිලිටරිමය වශයෙන් ද තවමත් අවියෝජනීය ලෙස බැඳී පවතින බව ද අප අමතක නොකළ යුතු කරුණකි.

# ඊශ්‍රායලය තව දුරටත් තම සීමා පුළුල් කරද්දී, ලෝකයෙන් ම ඊට විරෝධය






ඊශ්‍රායල් අග්‍රාමාත්‍ය, බෙන්ජමින් නෙතන්යාහු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීම ඇමතීමට පිවිසෙනවාත් සමගම විශාල රටවල් සංඛ්‍යාවක නියෝජිතයන් ඔහුට විරෝධය පළ කර ශාලාවෙන් පිටව යනු දැකගත හැකි විය. මෙසේ විරෝධය දක්වීමට හේතුව ලෙස සැලැකිය හැක්කේ ඊශ්‍රායලය විසින් ගාසා තීරයේ සිදු කරනු ලබන මහා මිනිස් සංහාරයයි.

2023දී ඊශ්‍රායලය ගාසා තීරයේ ආරම්භ කළ ප්‍රහාර නිසා මේ දක්වා මනුෂ්‍ය ඝාතන 80,000කට ආසන්නව සිදුව තිබේ. ගාසා තීරයේ පමණක් සාමාන්‍යයෙන් දිනකට ළමයින් සහ කාන්තාවන් ඇතුළුව 100ක් පමණ මරා දමමින් සිටී.

ගාසා තීරයට අමතරව පලස්තීනුවන් ජීවත්වන අනෙක් කලාපය වන බටහිර ඉවුර වෙතද මේ වන විට නැවත ඊශ්‍රායල් ව්‍යාප්තිය ඔවුහු ආරම්භ කර ඇත.

මතභේදාත්මක E1 ඊශ්‍රායල් පදිංචි කිරීම නැවත ආරම්භ කිරීම මගින් නිවාස 3,000ක් පමණ ඉදිකිරීමට සැලැසුම් කර ඇති අතර, මේ හරහා බටහිර ඉවුරේ පලස්තීන පාලන ප්‍රදේශය මැදින් ඊශ්‍රායල් කොරිඩෝවක් ඇති වේ.

ලෝකයේ බොහෝ රටවල් මෙයට විරෝධය පළ කර ඇති අතර, මේ හරහා පලස්තීනයේ පැවැත්ම තීරණාත්මක ලෙස අවසන් වන බව ඔවුන්ගේ අදහසයි. මීට කලින් ඊශ්‍රායල් සහයෝගී කඳවුරේ සිටි එක්සත් රාජධානිය පවා මෙම බටහිර ඉවුරේ ඊශ්‍රායල් නව පදිංචි කිරීම්වලට එරෙහිව ඊශ්‍රායලයට ආර්ථික සම්බාධක පැනවීමට පියවර ගෙන ඇත.

# වම - දකුණ බෙදෙන ජර්මනිය.

ජර්මනියේ State Parliament රාජ්‍ය පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයන් තෝරා ගැනීමේ මැතිවරණ මේ මාසයේ ආරම්භ විය.

සැප්තැම්බර් 06 වැනිදා තිබූ Saxony Anhalt රාජ්‍ය මැතිවරණයෙන් අන්ත දක්ෂිණාංශික ජර්මනිය සඳහා වූ විකල්පය (AFD) පක්ෂය 44%ක ප්‍රතිශතයක් ලබාගෙන ජයග්‍රහණය කිරීමත් සමඟ මුළු යුරෝපයේම ඇස් ඒ වෙත යොමු විය.

නමුත් 20/09 තිබූ බර්ලින් රාජ්‍ය මැතිවරණයේදී අන්ත දක්ෂිණාංශික AFD පක්ෂය පරාජය කරමින්, සමාජවාදී Die Linke පක්ෂය ජයග්‍රහණය කරන ලදී. දේශපාලන විචාරකයන්ගේ අදහස දක්ෂිණාශික අන්තවාදයට එරෙහි ජර්මන් වැසියන් වෙනත් මධ්‍යස්ථ පක්ෂ වෙනුවට වාමාංශික පක්ෂ වෙත නැඹුරු වෙමින් ඇති බවයි.




# ට්‍රම්ප්ගේ EO 14404 නියෝගයත් සමඟ කියුබාවට අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ආධාර රැගත් කන්ටේනර් 7,000කට වඩා අතරමඟ



ඇමෙරිකානු ජනාධිපති, ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් මැයි පළමුවැනිදා අත්සන් කරන ලද EO 14404 විධායක නියෝගයට අනුව කියුබාවට ආධාර කරන පුද්ගලයන් සහ සම්බන්ධතා පවත්වන සමාගම් සතුව ඇමෙරිකාව තුළ තිබෙන සියලු වත්කම් රාජසන්තක කිරීමට තීරණය කර ඇත.

එම තත්වය තුළ කිසිම නාවුක සමාගමකට කියුබාව වෙත භාණ්ඩ ප්‍රවාහණය කිරීමට නොහැකි වී ඇත. කියුබානු ජනතාවට අවශ්‍ය අත්‍යාවශ්‍ය ආහාර සහ ඖෂධ නොලැබී යාමේ භයානක අනතුරක් මතුව ඇත. කියුබානු විදේශ අමාත්‍ය බෲනෝ රොඩ්‍රිගෝ මහතා ප්‍රකාශ කළේ, ඇමෙරිකාව කිසිම සාධාරණ හේතුවක් නොමැතිව කියුබානු ජනතාව සමූහ දණ්ඩනයකට යටත් කර ඇති බවයි. ට්‍රම්ප්ගේ මේ නව ක්‍රියාමාර්ග නිසා කියුබානු සෞඛ්‍ය සේවයට අත්‍යවශ්‍ය සිරින්ජර ලක්ෂ 35ක්ද අතරමඟ සිරවී ඇති බව ඒ මහතා සඳහන් කළේය.

## ආර්ථික අර්බුදය සමනය......

01 - පිටුවෙන්

**සාමාන්‍ය ආහාර වර්ග කිහිපයක මිල ගණන්**

| විස්තරය | 2025 ඔක්තෝබර් | 2026 ඔක්තෝබර් (මුල් සතියේ මිල ගණන්) |
|---|---|---|
| සම්බා සහල් (01 කි.ග්‍රෑ) | 250 | 240 |
| රතු කැකුළු සහල් (01 කි.ග්‍රෑ) | 215 | 190 |
| බෝංචි (01 කි.ග්‍රෑ) | 500 | 550 |
| කැරට් (01 කි.ග්‍රෑ) | 164 | 230 |
| රතුලූනු (දේශීය) (01 කි.ග්‍රෑ) | 350 | 435 |
| අර්තාපල් (01 කි.ග්‍රෑ) | 292 | 383 |
| පොල් | 175 | 160 |
| පරිප්පු (01 කි.ග්‍රෑ) | 270 | 253 |
| | | 04 වගුව |

2025 වසරේ ඔක්තෝබර් මාසයේ සාමාන්‍ය ආහාර වර්ග කිහිපයක මිල 2026 වසරේ ඔක්තෝබර් මාසයේ මිල ගණන් සමග සැසැඳීමෙන් කිසියම් අදහසක් භාණ්ඩ මිල ඉහළ යාම සම්බන්ධයෙන් ලබාගත හැකි ය.

ඉහත 04 වගු සටහනට අනුව භාණ්ඩ කිහිපයක මිල ඉහළ ගොස් ඇති අතර, තවත් අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල පහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ උද්ධමනය විශාල ලෙස ඉහළ ගොස් ඇති බවටත්, ජනතාවට ජීවන බර දරා ගැනීමට නොහැකි බවටත් සඳහන් කරමින්, ආණ්ඩුවට විරුද්ධව ගෙන යන සටන් පාඨවල එතරම් වලංගුභාවයක් නොමැති බව ඉහත සංඛ්‍යා මඟින් තහවුරු වේ. ලෝකයේ විශාල අර්බුද සහ යුදමය තත්ත්වයක් තුළ වෙළෙඳාමට ඇතිවී තිබෙන බලපෑම ද සුළුපටු නොවන අතර, අප වැනි කුඩා ආර්ථිකයන් සහිත රටවලට ඒවායින් වන බලපෑම ඉතා විශාල ය. එවැනි තත්ත්වයක් යටතේ වුව ද, ලංකාවේ ආර්ථිකය ජනතාවට ගැටලුකාරී තත්ත්වයකට පත්වීමට ඉඩ නොදී අවශ්‍ය පහසුකම් සහ සහන ලබා දෙමින් ඉදිරියට රැගෙන යාම විශාල අභියෝගාත්මක ක්‍රියාවකි.

## සම්බාධක නොතකා........

02 - පිටුවෙන්

- චීන-වියට්නාම ආකෘතිය - රාජ්‍ය පාලනය රඳවා ගනිමින් පෞද්ගලික අංශයට වෙළෙඳපොළ විවෘත කිරීමේ ප්‍රතිසංස්කරණ 176ක් කියුබාව හඳුන්වා දී ඇත. සේවකයන් 100කට වැඩි පෞද්ගලික සමාගම්වලට අවසර දීම, විදේශගත කියුබානුවන්ට රට තුළ ආයෝජනය කිරීමට ඉඩ දීම සහ පෞද්ගලික ඖෂධ ශාලා ආරම්භ කිරීමට අවසර දීම මේ යටතේ සිදු වේ.
- රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා - ඉන්ධන අර්බුදය සමනය කර ගැනීම සඳහා කියුබානු ජනාධිපති මිගෙල් ඩයස් කැනෙල් ඇමෙරිකාව සමග රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කියුබාව විසින් දේශපාලන සිරකරුවන් 2,000කට අධික පිරිසක් නිදහස් කිරීමට ද පියවර ගෙන ඇති බව ද වාර්තා වේ.

කෙසේ වුව ද, එක්සත් ජනපදය විවෘතවම ප්‍රකාශ කර ඇත්තේ, වසර අවසන් වීමට පෙර කියුබාවේ පාලන තන්ත්‍රය වෙනස් කිරීම සිය මූලික ඉලක්කය බවයි. එහෙත්, එළැඹෙන නොවැම්බර් මස මුල යෙදෙන එක්සත් ජනපද කොන්ග්‍රසයේ හා සෙනෙට් මණ්ඩලයේ මැතිවරණයෙන් (වාර මැද මැතිවරණය) ලැබෙන ප්‍රතිඵලය ට්‍රම්ප්ට අවාසිසහගත වුවහොත්, කියුබානු සම්බාධකවල යම් වෙනස්කම් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද, කියුබාව කවර දුෂ්කරතා පැවැතිය ද, තමන්ගේ ප්‍රතිපත්ති ට්‍රම්ප් ඉදිරියේ පාවා නොදෙන ස්ථාවරයක දැඩිව සිටී.

## චුම්භකත්වයේ නව ආකාරයක්..........

03 - පිටුවෙන්

එමෙන්ම SSD වල ඇති දත්ත සුරැකීමේ ගුණය ද (විදුලිය විසන්ධි කළ පසු ද දත්ත එලෙසම පැවතීම) මෙම උපාංග සතු වීම තවත් වාසියක් ලෙස පවතී.

එමෙන්ම සාමාන්‍ය චුම්භක එකිනෙක අසලින් තැබූ විට ඒවා මඟින් බාහිරට ඇති කරන චුම්භක ක්ෂේත්‍රයන් එකිනෙකට බාධා කරනු ලැබුව ද, ඕල්ටර්මැග්නටිසම් විසින් එලෙස බාහිර චුම්භක ක්ෂේත්‍රයක් ඇති නොකිරීම නිසා එකිනෙකට ඉතා ආසන්නව දත්ත ගබඩා කිරීමේ හැකියාව ඇත. එම නිසා ඉතා කුඩා ඉඩක් තුළ වැඩි දත්ත ප්‍රමාණයක් ගබඩා කිරීමේ හැකියාව මේ අනුව ලැබේ.

වර්තමානයේ පරිගණකවල සහ දත්ත මධ්‍යස්ථාන සඳහා විශාල බලශක්තියක් වැය වන්නේ ඉලෙක්ට්‍රෝන චලනය කිරීමේ දී සිදුවන ප්‍රතිරෝධය නිසා තාපය ලෙස විදුලිය අපතේ යෑම නිසා ය. එමෙන්ම එමගින් උපාංග අධික ලෙස රත්වීම ද සිදුවේ. එහෙත්, ඕල්ටර්මැග්නටිසම් මඟින් ක්‍රියා කරන උපාංගවල දී විදුලි ධාරාව වෙනුවට ඉලෙක්ට්‍රෝනයේ බමනය පමණක් භාවිත කර දත්ත හුවමාරු කරන බැවින්, ශක්ති පරිභෝජනය අවම වීම මෙන්ම උපාංග රත්වීම ද අඩු වේ.

මෙවන් ගුණාංග රාශියක් නිසා කෘත්‍රිම බුද්ධිය සහ සුපිරි පරිගණක පදනම් කර ගත් වර්තමාන ලෝකය සඳහා ඕල්ටර්මැග්නටිසම් උපාංග අතිශය වාසිදායක වනු ඇත. එම ක්ෂේත්‍රවල වර්ධනයට පමණක් නොව අතිශය වේගවත්, කුඩා සහ කාර්යක්ෂම නව විද්‍යුත් උපකරණ බිහිකිරීමට ද මෙම සොයාගැනීම හේතුවනු ඇත.

## සිහිනයෙන් යථාර්ථයට.....

08 - පිටුවෙන්

'හිමකබාය', 'මළ මිනිස්සු', ප්‍රංශයේ ගුස්ටාව් ප්ලෝබයාගේ 'මැඩම් බොවාරි' ආදී උදාහරණ ගත හැකි ය.

සමාජ සත්තා යථාර්ථවාදී සාහිත්‍ය කලා රීතිය වඩාත්ම විප්ලවීය එකකි. මෙහි අරමුණ සමාජය පවතින ආකාරයෙන් විවේචනය කිරීමට වඩා නව සමාජය (සමාජවාදී අවධිය) ගොඩනැඟීම සඳහා සමාජයේ මිනිසා වෙනස් විය යුතු ආකාරය පෙන්වා දීමයි. මෙහි විශේෂ ලක්ෂණ වන්නේ නිර්ධන පංති මතවාදයට පක්ෂපාතීත්වයත්, සමාජ සංවර්ධනය පිළිබඳ දාර්ශනික සුබවාදයත්, සමාජ වීරත්වයත්, පංති සටන තුළ පවතින මානවවාදයත් ය. මක්සිම් ගෝර්කිගේ 'අම්මා', ඔස්ත්‍රොව්ස්කිගේ 'වානේ පන්නරය ලැබූ හැටි', චිංගිස් අයිත්මාතව්ගේ 'ගුරු ගීතය' ආදී සමාජවාදී සෝවියට් දේශයේ උදාහරණ මෙන්ම සමාජවාදී චීන, වියට්නාම්, කියුබානු උදාහරණ ගත හැකි ය.

රොමැන්ටික්වාදය සිහින ලෝකයත්, විවේචනාත්මක යථාර්ථවාදය ධනවාදයේ සැබෑ ලෝකයත්, සමාජ සත්තා යථාර්ථවාදය සමාජ සත්තාවේ අනාගතයත් නියෝජනය කළේය.

# සිහිනයෙන් යථාර්ථයට, යථාර්ථයෙන් සමාජ සත්තාවට

**සැප්තැම්බරය සාහිත්‍යය පිළිබඳව කතා කරන මාසයයි. ඔක්තෝබරය ඒ උත්තේජනයෙන් සාහිත්‍යය කියවන මාසයයි. ලාංකීය සමාජයේ වන එම සාහිත්‍ය පෙළැඹුම හෝ හඬ අතිශය වැදගත්ය. එම අවධාරණය සහිතව විමර්ශන ඔබට මෙම ලිපිය ඉදිරිපත් කරන්නෙමු.**

**සාහිත්‍ය කලාව පැනනැගින්නේ අහඹු ලෙස නොවේ. එය නිශ්චිත සමාජ ක්‍රමයක නියෝජනයකි. එමෙන්ම එය නිශ්චිත පංති අවශ්‍යතාවක් ඉටු කරයි. එහිදී විවිධ කලා රීතින් පැනනඟී. සාහිත්‍ය කලා රීතියක් යනු නිශ්චිත සමාජ ක්‍රමයක යම් පංතිමය ප්‍රකාශ වීමක් සහිතව කලාකරුවන් හා විචාරකයන් ඇති කර ගන්නා ලෝක දෘෂ්ටිය, ශිල්පීය ක්‍රමවේද සහ ආකෘතීයය. එය සමාජ සම්බන්ධතාවන් ප්‍රතිනිර්මාණය කරන විශේෂිත සාහිත්‍ය කලා උපායමාර්ගයකි. 17 වන සියවසේ සිට 20 වන සියවස සහ ඉන් ඉදිරියට පැවැති, පවතින ප්‍රධාන කලා රීතීන් තුනක් හමුවේ. ඒ රොමැන්ටික්වාදය, විවේචනාත්මක යථාර්ථවාදය සහ සමාජ සත්තා යථාර්ථවාදයයි.**

ධනවාදය ආරම්භයේ පැනනැගුණු පළමු සාහිත්‍ය කලා රීතිය රොමැන්ටික්වාදයයි. එය 1789 සිට 1850 දක්වා පමණ පැවැතිණ. මෙහි ආරම්භයට පසුබිම සැකැසෙන්නේ පොදු සමාජයට වඩා පුද්ගල නිදහස යන්න (ශ්‍රමය විකුණන්නෙක් බිහිකිරීමට එය අවශ්‍ය විය.) දැඩි සංවාදයට ලක්වූ ප්‍රංශ විප්ලවය සමඟය. රොමැන්ටික්වාදය ආදරය, පරිසරලෝලීබව සහ අතීතකාමය හුවා දක්වන්නක් විය. කාව්‍යයේ සිට බීතෝවන්ගේ සංගීතය දක්වා මෙය පැතිරුණු රීතියක් විය. මෙම රීතියේදී හැඟීම්වලට ප්‍රමුඛතාවක් ලැබේ. අසීමිත පරිකල්පනය සහ සිහින ලෝක මෙහි බහුලය. රොමැන්තික්වාදය යථාර්ථයෙන් බැහැරය. වැඩවසම් සමාජ ක්‍රමය පසු



කරමින් ධනවාදයට එළැඹෙද්දී ඇතිවූ පුනරුද යුගයේ තාර්කික බවට සහ කාර්මික විප්ලවයේ යාන්ත්‍රික බවට එරෙහිව මනෝභාවයන්ට මුල් තැන දීම, යාන්ත්‍රික අපිරිසිදු නගරවලට එරෙහිව ස්වභාවධර්මය දේවත්වයේ සැලැකීම, (ධනේශ්වර අර්බුදයේ පංති ගැටුමට එරෙහිව.) සිහින ලෝක, අතීතකාමය, පුද්ගලවාදය හා කැරැලිකාරීත්වය මෙහි අඩංගුය.

විවේචනාත්මක යථාර්ථවාදී සාහිත්‍ය කලා රීතිය පැනනැගින්නේ 19 වන සියවස මැද එනම්, 1848න් පසු යුරෝපයේ විප්ලවීය පිබිදීමත් සමඟය. බ්‍රිතාන්‍යය, ප්‍රංශය සහ රුසියාවේ මෙය වඩාත් ප්‍රචලිත විය. සමාජයේ සැබෑ තත්ත්වය විවෘත ලෙස කලාවෙන් හුවා දැක්වීමේ අවශ්‍යතාව පැනනැඟි විෂයමූල අවශ්‍යතාව බිහි කළ සාධක තුනකි. එක, ධනවාදයේ හරය වන ශ්‍රම සූරාකෑමත්, දෙවනුව, දරුණු දරිද්‍රතාව සහ තෙවනුව, දරුණු සමාජ විෂමතාව පෙන්වන ජීවන සටනයි. මනෝරාජික සිහින සහිත රොමැන්ටික්වාදයට එරෙහි යථාර්ථවාදී රීතියක් ලෙස මෙය බිහිවේ. හේතුඵලවාදී චින්තනයේ පිබිදීමත් එයට බලපෑවේය. එක්සත් රාජධානියේ චාල්ස් ඩිකන්ස්ගේ 'ඔලිවර් ට්විස්ට්', ටොල්ස්ටෝයිගේ 'යුද්ධය හා සාමය', 'ඇනා කැරනිනා', ඩොස්ටොව්ස්කිගේ 'අපරාධය හා දඬුවම', ගොගොල්ගේ

07 පිටුව



"සාහිත්‍යයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය සහ සැබෑ වීරයා විය යුත්තේ 'ශ්‍රමය' (Labor) සහ ශ්‍රමයේ යෙදෙන මිනිසාය. මිනිසා විසින් සොබාදහමද, තමා ජීවත් වන ලෝකයද පරිවර්තනය කරනු ලබන්නේ තමන්ගේම ශ්‍රමය සහ සාමූහික ක්‍රියාකාරකම් මඟිනි. එබැවින්, නව ලේඛකයා විසින් උත්කර්ෂයට නැංවිය යුත්තේ රජවරුන් හෝ හුදෙකලා ධනපතියන් හෝ නොව, නව ලෝකයක් ගොඩනඟන නිර්ධන පන්ති ශ්‍රමිකයාගේ ජයග්‍රහණ සහ ඔහුගේ සාමූහික ශක්තියයි."

මක්සිම් ගෝර්කි